පාර්ලිමේන්තුවේ පුස්තකාලය
1979 - 1 - 17
කොළඹ

## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

# 1978 අංක 14 දරන වතු කම්කරු (ඉන්දියානු) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1978 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 15යි    තැපැල් ගාස්තුව : ශත 25යි

# 1978 අංක 14 දරන වතු කම්කරු (ඉන්දියානු) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 50/77

## වතු කම්කරු (ඉන්දියානු) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1978 අංක 14 දරන වතු කම්කරු (ඉන්දියානු) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වතු කම්කරු (ඉන්දියානු) ආඥාපනතේ 21 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 133 වන අධිකාරයේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) ඉහත දැක්වෙන පරිදි මේ වගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින්නාවූ ද මේ වගන්තිය මගින් නියම කොට ඇති ප්‍රකාශය කිසියම් මාසයක දී නියමිත කාලය තුළ සැපයීම පැහැර හරින්නාවූ ද යම් සේවායෝජකයකු හෝ යම් සහකාර අධිකාරිවරයකු වරදක් කරන අතර පළමුවරට වරද කරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් දක්වා දීර්ඝ විය හැකි දඩයකට ද දෙවනවරට හෝ ඊට තදනන්තරව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසිය පණහක් දක්වා දීර්ඝ විය හැකි දඩයකට ද ඔහු යටත් විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) යම් කම්කරුවකු යම් සේවායෝජකයකුගේ සේවය අතහැර යන අවස්ථාවේ දී "ආ" උපලේඛනයේ II වන ආකෘතියට සාරානුකූලව අස්වීමේ සහතිකයක් ඒ කම්කරුවාට නිකුත් කිරීම ඒ සේවායෝජකයාගේ කාර්යය විය යුතු ය."; තව ද

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ජ37433—12,975 (78/12)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි, (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500 රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.